# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 7,880 — 1931ක්වූ සැප්තැම්බර් මස 11 වෙනි දිනවූ සිකුරාදා.


## Part IV.—හතරවෙනි කාණ්ඩය.

### ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම.

ඌව දිසාවේ ඉඩම් බදු විකිණීමයි.

වර්‍ෂ 1930ක්වූ සැප්තැම්බර් මස 12වෙනි දින නිකුත් ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ වර්‍ෂ 1930ක්වූ සැප්තැම්බර් මස 1වෙනි දින හා අංක 41 දරණ බදුල්ල දිස්ත්‍රික්කයේ ඉඩම් සශ්‍රිකකිරීමේ දැන්වීමෙහි ඇතුළත්වූ මියනකදුර යන ගම පිහිටි මෙහි පහත සඳහන්වෙන රජසන්තක ඉඩම් කොටස්වල බද්ද ඌව දිසාවේ ආණ්ඩුවේ දිසාපති උන්නාන්සේ විසින් වර්‍ෂ 1931ක්වූ ඔක්තෝබර් මස 26වෙනි දින සවස 1.45ට බදුල්ල කච්චේරියේදී විකිණීමට දමනු ලැබේ. ඉඩම් සශ්‍රිකකිරීමේ දැන්වීමක් යටතේ සීමාකරණලද්ද වෙන්දේසියෙන් විශෙෂ විකිණීම් වගන්ති අනුව මෙම විකිණීම කරනු ලැබේ. එම විශෙෂ වගන්තිවල පිටපතක් කච්චේරියෙන් ඉල්ලා බලාගත හැක.

අවසාන ගම් සිතියමේ (ප්ලෑනේ) අංකය. 262. ගම—මියනකදුර. කෝරළය—බුත්තල කඩුකර. දිස්ත්‍රික්කය—බදුල්ල.

| | | | | | | ප්‍රථම වර්‍ෂ 30දී අවුරුද්දකට අක්කරයකට ගෙවියයුතු බද්ද. | |
|---|---|---|---|---|---|---|---|
| සිම කැල්ල. | ඉඩමේ නම. | විස්තර. | ඉල්ලුම්කාරයා. | ප්‍රමාණය. අ. රූ. ප. | අක්කරයකට මුලින් ගෙවියයුතු මුදල වශයෙන් වෙන්දේසිය පටන් ගන්නා මිල. රු. ශ. | ප්‍රථම වර්‍ෂ 6යේ එක් එක් වර්‍ෂයට. රු. ශ. | ඉතිරි වර්‍ෂ 24යේ එක් එක් වර්‍ෂයට. රු. ශ. |
| 1G | වටගොඩ කොම්මන | පතන, වකරන් සෙවිලි ගරක් ගාල් දෙකක්ද, වකරන් සෙවිලි කඩ කුස්සි දෙකක් හා කොටසක් වකරන් සෙවිලි කළ ලෑසින් කාමරවලින්යුත් ගෘහයකි | — | 4 3 22 | 6 0 | 2 0 | 6 0 |
| 7 | වැලිකපල්ලේතලාව පතන | .. | — | 57 1 19 | 7 20 | 2 40 | 7 20 |

වර්‍ෂ 1931ක්වූ සැප්තැම්බර් මස 5වෙනි දින කොළඹ ඉඩම් කොමසාරිස්තැනගේ කන්තෝරුවේදීය.

සී. වී. බ්‍රෝන්,
ඉඩම් කොමසාරිස් වෙනුව.

---

### ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම්.

වර්‍ෂ 1876ක්වූ අවුරුද්දේ තොම්මර 3යෙන් ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—පොදුජනයාගේ ප්‍රයෝජනයට ලිඳක් කැනීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්‍ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රීසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නියෝගකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. 14,273. ගම—මඩකුඹුර.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | කොටවෙළඋඩුමුල්ල | ලිංදෙකක් සහ උළුසෙවිලි කරපු ගෙයක් තිබෙන වත්ත | තල්ගහවත්තේ පදිංචි ඉලන්දාරිදේවගේ ජනිස් | 0 0 26·2 |
| 2 | එම | කුඹුර | එම | 0 0 7·8 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනාම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1931ක්වූ ඔක්තෝබර් මස 6වෙනි දින පස්වරු 2ක් කනිසමට ගාල්ලේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනක් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1931ක්වූ සැප්තැම්බර් මස 5වෙනි දින ගාල්ලේ කච්චේරියේදීය.

ජී. ඇස්. වුඩ්මන්,
ආණ්ඩුවේ මහා ඒජන්ත වම්භ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—පාරකට පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" නමැති කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

නො. 1,453 දරණ අවසාන සිතියමෙන් උපුටාගන්නාලද නො. 1 දරණ සිතියම.

ගම—කටුගම්පොළහත්පත්තුවේ තිහියමකෝරළේ, මලහාව.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 9B | කුරුඳුකුඹුර | ගස්සහපාර | ඒ. කේ. හිංගිරිබංඩා සහ තවත් අය | 0 0 1·5 |
| 9C | බොලාවෙල | එම | කේ. අප්පුසිංඤෝ සහ තවත් අය | 0 0 3·5 |
| 9D | එම | එම | එම | 0 0 0·5 |
| 16B | කජුගහවත්ත | එම | ඒ. කේ. හිංගිරිබංඩා සහ තවත් අය | 0 0 2·4 |
| 16A1 | කොස්ගහවත්ත | එම | කේ. අප්පුසිංඤෝ සහ තවත් අය | 0 0 1 |
| 17A1 | කොහොඹගහවත්ත | එම | ඒ. කේ. බංඩප්පුහාමි සහ තවත් අයෙක් | 0 0 1·5 |
| 17B | කොස්ගහවත්ත | එම | කේ. අප්පුසිංඤෝ සහ තවත් අය | 0 0 19·5 |
| 17C | එම | එම | එම | 0 0 15 |
| 19C | එම | එම | එම | 0 0 1 |
| 19D | එම | එම | එම | 0 0 1·7 |
| 19E | එම | එම | එම | 0 0 0·6 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදු ජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනාම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1931ක්වූ ඔක්තෝබර් මස 9වෙනි දින පෙරවරු 10යේ කනිසමට බිංගිරියේ තානායමේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1931ක්වූ සැප්තැම්බර් මස 3වෙනි දින කුරුණෑගල කච්චේරියේදීය.

ජේ. ආර්. වෝල්ටර්ස්,
වැඩබලන ආණ්ඩුවේ ඒජන්ත වම්භ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—ඉඩමේ ගමට ලිඳක් කැපීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" නමැති කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

නො. 184A අන්තිම ගම් සිතියමේ නො. 1ක් අතිරේකය. ගම—කුඹල්වෙලකෝරළේ ඉඹගමගම.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 22C1 | හිබිලියගහහේන | ආණ්ඩුව මගින් ගලෙන් බැඳපු ලිඳක් තිබෙන හේන | රජසන්තක, බදුකාරයා ඇල්ලේ කේ. බී. කදුරුගමුවේ මහත්මයා | 0 0 2 |
| 22C2 | එම | අඹපාර | එම | 0 0 4 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනාම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1931ක්වූ ඔක්තෝබර් මස 29වෙනි දින අපරභාග 2ක් කනිසමට බදුල්ල කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනක් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1931ක්වූ සැප්තැම්බර් මස 2වෙනි දින බදුල්ල කච්චේරියේදීය.

ඊ. පී. මීලිත්වන්,
ඌවේ ආණ්ඩුවේ ඒජන්ත වම්භ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3යේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—හත්ගොමුවේ පාඨශාලාවට වත්තක් සහ ක්‍රීඩා භූමියක්ද සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" නමැති කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබීතිබේ, ඒ ඉඩම් නම්:—

සිතියමේ නො. 84. ගම—හත්ගොමුව, හවදුන්කෝරළේ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 30 | කහුවත්තඅස්වැද්දුම නොහොත් මෝදරකඩ අස්වැද්දුම | කුඹුර | ඇස්. ඇල්. ඇම්. ලෙබ්බේ සහ තවත් අය | 0 1 33·8 |
| 30A | කහත්තේවත්ත | වත්ත | එම | 0 0 2·3 |
| 40C | එම | එම | එම | 0 3 13 |

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 40D | කපුවත්තඅස්වැද්දුම හොහොත් කුඹුර මෝදරකඩ අස්වැද්දුම | .. | ඇස්. ඇල්. ඇම්. ලෙබ්බේ සහ තවත් අය ... | 0 0 3·7 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඔනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම හොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්‍ෂ 1931ක්වූ ඔක්තෝබර් මස 9වෙනි දින උදේ 10යේ කන්තෝරුවට අවිස්සාවේල්ල තානායම්පොලේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයිඅන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඔනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඔනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්‍ෂ 1931ක්වූ සැප්තැම්බර් මස 4වෙනි දින
රත්නපුරේ කච්චේරියේදීය.

සී. එච්. කොලින්ස්,
සබරගමු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත වර්‍යා.

---

රජසන්තක ඉඩම් මැනීම ගැණ දෙන ඉල්ලුම්පත්‍ර.

වයඹ දිසාවේ ආණ්ඩුවේ ඉඩම් ඉල්ලුම්පත්‍ර පිට මැනීම සම්බන්ධව දැන්වීමයි.

කුරුණෑගල දිස්ත්‍රික්කේ නොමමර එකේ කොඨාසය හැටියට සලකන වැලිඩවිල්ලි හත්පත්තුවද, දඹදෙනි හත්පත්තුවද, දේවමැදිහත්තුවද, කටුගම්පොලහත්පත්තුවද, හිරියාල හත්පත්තුවේ තිත්තවැලිගන්දහය, හැටහය, ඉහලවිසිදෙකයන කෝරලද, කිඹුල්වානාඔයේ දකුනට පිහිටි මහගල්බොඩ එගොඩකෝරලේ කොටසක්ද, ඉල්ලුම්පත්‍ර පිට ඉඩන්මැනීමට වර්‍ෂ 1931ක්වූ ඔක්තෝබර් මස 31වෙනි දින තීරණයකරණු ලැබේ.

එබැවින් එකී දිනට පසු ලැබෙන ඉල්ලුම්පත්‍ර මෙම කොඨාසයේ තීරණයක් නැවත කරණතුරු මැනීමට පිටත්කරණු නොලැබේ. කාරණ එසේවුවත් ලියාපදිංචිකර තැබීම පිණිස හෝ යම්කිසි බිමක් විකිණීම බදුදීම ආදී පිළිබඳ කාරණ හෝදිසිය පිණිස හෝ ඉල්ලුම්පත්‍ර ඉදිරිපත්කිරීමට බාධාවක් නැත.

ජේ. ආර්. වෝල්ටර්ස්,
වයඹ දිසාවේ ඒජන්ත වර්‍යා.

වර්‍ෂ 1931ක්වූ සැප්තැම්බර් මස 3වෙනි දින
කුරුණෑගල කච්චේරියේදීය.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.